**අධ්‍යාපන අමාත්‍යාංශය**

**විභාග කොමසාරිස් ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් ධූරය 2021 නොවැම්බර් 27 දින සිට පුරප්පාඩු වීමට නියමිතව ඇති බැවින් ඒ සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් / නිලධාරිනියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු / නිලධාරිනියක වීම.
2. අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර පහ තුළ අයදුම්කරු / අයදුම්කාරිය,
   - I. සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   - II. නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
   - III. විනයානුකූල දඬුවමකට යටත් වී නොතිබීම.

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් / නිලධාරිනියන් මේ සමග ඇති ඇමුණුමෙහි සඳහන් තොරතුරුද ඇතුළත් කර, තමන් විසින්ම සකස් කරගත් අයදුම්පතක් 2021.10.14 දින හෝ ඊට පෙර moecombinedservice@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

රාජ්‍ය අමාත්‍යාංශ වල සේවයේ නියුතු නිලධාරීන් / නිලධාරිනියන් සිය අයදුම්පතෙහි දෘඪ පිටපතක්ද අදාළ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් ඉදිරිපත් කළ යුතු වේ.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් තනතුර සඳහා අයදුම් පත්‍රය

01. <u>පෞද්ගලික තොරතුරු</u>

I. සම්පූර්ණ නම: ........................................................................................(මයා/මිය)

II. උපන් දිනය:

III. ජාතික හැඳුනුම්පත් අංකය:

IV. ලිපිනය: පෞද්ගලික:............................... රාජකාරි: ........................

V. විද්‍යුත් තැපැල් ලිපිනය:

VI. දුරකථන අංකය: රාජකාරි :........................... ජංගම : .................................

02. <u>සේවා තොරතුරු</u>

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන පරිපාලන සේවයට ඇතුළත් වූ දිනය:

II. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට පත්වූ දිනය:

III. දැනට දරණ තනතුර:

IV. පූර්වාසන්න වසර 10 තුළ සේවා විස්තර:

| අනු අංකය | තනතුර හා සේවා ස්ථානය | සේවා කාලය | | දරණ ලද වගකීම |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

03. <u>අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u> :

I. අධ්‍යාපනික සුදුසුකම්

II. වෘත්තීය සුදුසුකම්

III. වෙනත් සුදුසුකම්

**04. <u>ඉදිරි සැලසුම් පිළිබඳ වාර්තාව</u>**

**විභාග කොමසාරිස් ජනරාල් වශයෙන් තෝරා ගනු ලැබුවහොත් විභාග දෙපාර්තමේන්තුවේ උන්නතිය සඳහා එහි දැක්ම හා මෙහෙවර අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩපිළිවෙල ඇතුළත් කෙටි වාර්තාවක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

**තවද සුදුසුකම් සලකා බැලීමේ සම්මුඛ පරීක්ෂණයේදී එකී වාර්තාව පිළිබඳව මිනිත්තු 10ක ඉදිරිපත් කිරීමක් සිදුකළ යුතු ය.**